ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - (2015/I)**

රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (04)

කාලය පැය 03යි.

---

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 04 කටද, ප්‍රශ්න අංක 06 හා 07 න් එක් ප්‍රශ්නයකටද පිළිතුරු සැපයිය යුතුවේ.**

01. රාජ්‍ය මූල්‍ය කළමණාකරණයට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන කවරේද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 20)

02. (අ) රජයේ සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ පාර්ලිමේන්තුවට උත්තර දීම මුදල් අමාත්‍යවරයාගේ යුතුකම වේ. ඔහු එම යුතුකම ඉටු කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 10)

(ආ) රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපති වෙත පැවරී ඇති බලතල කවරේද? කෙටියෙන් දක්වන්න.

(ලකුණු 06)

(ඇ) ඉහත සඳහන් ආයතන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපති වෙත පැවරී ඇති බලතල ප්‍රමාණවත්ද? ඔබේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

03. (අ) රජයේ ආදායම්, පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ ඇස්තමේන්තු සැකසීමේ වගකීම පවතින්නේ කුමන ආයතන වලටද? කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

(ආ) වැඩක මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා වියදම් දැරීමට සිදුවන බව පෙනී යන විට එකී සමස්ථ පිරිවැය වැඩිකිරීම සඳහා මු.රෙ 72 ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතුය. මු.රෙ 72 හි සඳහන් පරිදි එම අධිකාරී බලය පැවරී ඇති අධිකාරීන් සහ එම අධිකාරීන්ගේ සීමාවන් කවරේද? කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)